**ශීර්ෂ 116 - සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| **ශීර්ෂ** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 298 | මිණුම් ඒකක, ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුව. |
| 300 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව. |
| 301 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. |
| 302 | සමුපකාර සේවක කොමිෂන් සභාව. |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, ඇවර කිරීමේ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරින් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| **ශීර්ෂ** | **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය** |
|---|---|---|
| 116 | සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 2015.08.31 |
| 298 | මිණුම් ඒකක, ප්‍රමිත හා සේවා දෙපාර්තමේනතුව | 2015.07.01 |
| 300 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 2015.08.31 |
| 301 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 2015.07.29 |
| 302 | සමුපකාර සේවක කොමිෂන් සභාව | 2015.07.13 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම**

විසර්ජන ගිණුම්, ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 04 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,995.18 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,774.09 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 0.72 ක සිට රු.මිලියන 200.13 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3.16 ක සිට සියයට 13.97 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 116 | 1,433.05 | 1,232.92 | 200.13 | 13.97 |
| 298 | 302.36 | 292.81 | 9.55 | 3.16 |
| 300 | 174.71 | 167.72 | 6.99 | 4.00 |
| 301 | 71.98 | 68.28 | 3.70 | 5.14 |
| 302 | 13.08 | 12.36 | 0.72 | 5.50 |
| එකතුව | **1,995.18** | **1,774.09** | **221.09** | **11.08** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 04 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 11601 | 7.50 | 7.26 | 3.40 | 4.25 | 30.00 | 19.98 |
| 29801 | 8.00 | 3.40 | 3.00 | 3.48 | 35.00 | 18.38 |
| 30001 | 7.50 | 3.75 | 3.70 | 3.87 | 42.00 | 18.29 |
| 30101 | 5.00 | 2.29 | 2.00 | 2.25 | 20.00 | 12.14 |
| 30201 | 1.50 | 0.74 | 0.30 | 0.89 | 4.00 | 1.94 |

### 2.2.2 ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවකට අදාළ අත්තිකාරම් ගිණුම් 02 ක් 2003 ජනවාරි 01 දින හා 2005 ජනවාරි 01 දින වන විට ඇවර කිරීමට තීරණය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| දෙපාර්තමේන්තුව | අත්තිකාරම් ගිණුම් කාර්යය | ගිණුම් අංකය | ඇවර කිරීමට තීරණය කර තිබුණු දිනය | 2014 දෙසැම්බර් 31 දිනට ගතවී තිබුණු කාලය (වර්ෂ) |
|---|---|---|---|---|
| ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | (i) මුළුතැන්ගෙය හා බේකරි අත්තිකාරම් ගිණුම | 7000/0/0/0300/0002 | 2003 ජනවාරි 01 | 12 |
| | (ii) ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ හා බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුම | 7000/0/0/0300/0003 | 2005 ජනවාරි 01 | 10 |

## 2.3 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 03 ක 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 73.27 ක් විය. එදිනට සමූපකාර සේවක කොමිෂන් සභාවේ අග්‍රිම ගිණුමේ ශේෂයක් නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|
| | | | රු.මිලියන |
| 116 | සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 7002/0000/00/0046/0014/000 | 31.58 |
| 298 | මිණුම් ඒකක, ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුව | 7002/0000/00/0327/014/000 | 8.28 |
| 300 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 7002/0000/00/0107/0013/000 | 32.03 |
| 301 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 7002/0000/00/0108/0014/000 | 1.38 |
| | **එකතුව** | | **73.27** |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 189.43 ක් විය. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|
| | | | රු.මිලියන |
| 116 | සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 6000/0000/00/0015/0029/000 | 25.76 |
| 300 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0008/0013/000 | 76.67 |
| | -එම- | 6000/0000/00/0013/0023/000 | 64.16 |
| | -එම- | 6000/0000/00/0015/0155/000 | 8.36 |
| 301 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0156/000 | 0.19 |
| | -එම- | 6000/0000/00/0006/0080/000 | 14.29 |
| | **එකතුව** | | **189.43** |

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්, ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 7 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

## 3. ශීර්ෂ 116 - සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

## 3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල්වල පහත දක්වා ඇති වර්ෂ වෙනුවෙන් වූ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | ආර්ථික මධ්‍යස්ථානයේ නම | මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොකළ වර්ෂ |
|---|---|---|
| (i) | මීගොඩ | 2003 සිට 2011 දක්වා |
| (ii) | නාරාහේන්පිට | 2008 සිට 2012 දක්වා සහ 2014 |
| (iii) | රත්මලාන | 2009 සිට 2012 දක්වා සහ 2014 |
| (iv) | වැලිසර | 2003 සිට 2011 දක්වා සහ 2013 හා 2014 |
| (v) | වේයන්ගොඩ | 2007 සිට 2009 සහ 2014 |
| (vi) | කැප්පෙටිපොල | 2001 සිට 2011 දක්වා සහ 2013 හා 2014 |
| (vii) | දඹුල්ල | 1999 සිට 2011 දක්වා |
| (viii) | නුවරඑළිය | 2006 සිට 2014 දක්වා |
| (ix) | කුරුඳුවත්ත | 2012 සිට 2014 |
| (x) | කන්දෙහන්දිය | 2004 සිට 2014 දක්වා |
| (xi) | තඹුත්තේගම | 2005 සිට 2011 දක්වා සහ 2014 |
| (xii) | ඇඹිලිපිටිය | 2003 සිට 2014 දක්වා |
| (xiii) | පිළියන්දල | 2010 සිට 2014 දක්වා |

## 3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය හා සතොස ආයතනය අතර ගොඩනැගිලි කුලී වෙනුවෙන් ඇතිකර ගත් බදු ගිවිසුම විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) දඹුල්ල, මීගොඩ හා වේයන්ගොඩ යන ආර්ථික මධ්‍යස්ථානවල එකතුව රු.223,936,355 ක් වූ වත්කම් අයිතම් 22 ක්ද, රු.130,653 ක් වූ වගකීම් අයිතමයක් හා රු.2,009,861 ක් වූ වියදම් අයිතම් 05 ක සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 3.3 විසර්ජන ගිණුම

### 3.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 03 කට හා මූලධන වැය විෂයයන් 05 කට සළසා තිබුණු එකතුව රු.167,180,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 06 ක් සඳහා එකතුව රු.6,468,900 ක අධිප්‍රතිපාදන සළසා තිබීම නිසා එකතුව රු.2,479,352 ක උපයෝජනයන් කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 85 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව 116-01-03-01-1503 වැය විෂයයට රු.මිලියන 10 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ගෙන් මාරු කර ගෙන තිබුණත්, එම ප්‍රතිපාදනය මුළුමණින්ම ඉතිරි වී තිබුණි.

(ඈ) 2013 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා අමාත්‍යතුමාගේ මාධ්‍ය අංශයට පුවත් පත් මිලදී ගැනීම වෙනුවෙන් වැයකළ රු.41,610 ක් ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි.

## 3.4 අග්‍රිම ගිණුම

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 04 දිනැති අංක RES/IMPREST/1 දරන ලිපියට අනුව, 2013 දෙසැම්බර් 31 දිනට පෙර රු.31,570,549 ක අග්‍රිම ශේෂය පියවිය යුතු බව දන්වා තිබුණත්, 2015 අප්‍රේල් 29 දින වන විටත් එම අග්‍රිම ශේෂය පියවා නොතිබුණි.

## 3.5 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 ජූනි 03 දිනැති අංක 218/2011 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව අංක 6000/0000/00/0003/0183/000 දරන පැරණි පොදු තැන්පත් ගිණුමෙහි පැවති රු.1,678,458 ක ශේෂය 6000/0000/00/0015/0029/000 දරන පොදු තැන්පත් ගිණුමට 2011 අගෝස්තු 26 දින මාරු කර තිබුණි. එම චක්‍රලේඛයේ 2 ඡේදය අනුව වසර 02 ක් ඉක්මවා තිබුණු ශේෂයන් රජයේ ආදායමට බැර කිරීමට උපදෙස් දී තිබුණද, 2011 අගෝස්තු 26 දින මාරු කළ රු.1,678,458 ක ශේෂය 2015 ජූනි 17 දින වන විටත් රජයේ ආදායමට බැර කර නොතිබුණි.

(ආ) 2009 දෙසැම්බර් 31 දින සිට පැවත එන ආර්ථික මධ්‍යස්ථානවල එකතු කළ අගය මත බදු සමඟ රඳවාගත් රු.1,198,604 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ පැවති එකතුව රු.15,408,138 කින් රු.මිලියන 15 ක් සහල් අපනයනය වෙනුවෙන් වී අලෙවි මණ්ඩලය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, එම මුදල මාස 11 ක පමණ කාලයක් වී අලෙවි මණ්ඩලය වෙත ප්‍රේෂණය නොකර බැංකු ජංගම ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

විෂය අංක 11601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වසර 09 කට වඩා වැඩි කාලයකට පෙර විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් තවදුරටත් අයවිය යුතු රු.4,261 ක මුදල සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.4 හා 4.2.5 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 05 ක හා වසර 12 ක කාලයකට පෙර සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.62,776 ක ණය ශේෂ 02 ක් විගණන දින වූ 2015 අප්‍රේල් 30 දින වන විටත් අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 02 ක කාලයක සිට පැවත එන මිය ගිය නිලධාරියෙකුගේ අයවිය යුතු රු.149,665 ක ණය ශේෂය ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කර 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2015 මැයි 08 දින ඉදිරිපත් කර තිබුණද, අමාත්‍ය කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2015 මැයි 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය කිරීම**

2007 වර්ෂයේ සිට වෙනත් ආයතන සතු එකතුව රු.24,800,000 ක වාහන 03 ක් අමාත්‍යාංශයේ පරිහරණයට යොදාගෙන තිබුණි.

**3.8 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (I) මුදල් රෙගුලාසි 135 සිට 139 | මීගොඩ සහ වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානවල ගෙවීම් වවුචර් මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 384(2) | දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන විසින් නිකුත් කර තිබුණු චෙක්පත්වල “ගනුදෙනු කළ නොහැක” යනුවෙන් රේඛනය කර |

නොතිබුණි.

| | | |
|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 395 | බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර එළඹෙන මාසයේ 15 වන දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කර යුතු වුවත්, මීගොඩ හා වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානවල 2012 වර්ෂය සඳහා හා ඊට පෙර සිට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 446(2) | මුදල් පොතේ ලැබීම් හා ගෙවීම් අනුව කාලානු ක්‍රම පිළිවෙලින් දිනපතා සටහන් කර අධීක්ෂක හෝ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සියළුම සටහන් හා මුදල් ශේෂ නිවැරදි බවට සාක්ෂියක් ලෙස අත්සන් තැබිය යුතු වුවත්, එම අවශ්‍යතාවයට අනුව මීගොඩ හා වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානවල මුදල් පොත් පවත්වා නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 751 | වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද, මීගොඩ හා වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානවල ආරම්භයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 751(1) | මීගොඩ හා වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානවල වත්කම් සම්බන්ධයෙන් ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| **(ආ)** | **රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ**<br>**-----------------------------**<br>2004 ජුලි 29 දිනැති අංක පීඊඩී 25 දරන චක්‍රලේඛය | අතිරික්ත මුදල් බැංකු ගිණුම්වල ආයෝජනය කිරීමට පෙර මුදල් ඇමතිවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුව ද, මීගොඩ හා වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථාන විසින් 2012 දෙසැම්බර් 31 දින වන විට ආයෝජනය කර තිබූ එකතුව රු.36,847,979 ක ආයෝජන සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| **(ඇ)** | **රාජ්‍ය මුදල් චක්‍රලේඛය**<br>**------------------------**<br>2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන චක්‍රලේඛය | |
| | (i) 3.3 (ආ) ඡේදය | දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ කළමනාකරණ භාර අරමුදල් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| | (ii) 4 ඡේදය | අරමුදලේ අරමුණුවලට අනුකූලව පිළියෙල කළ වාර්ෂික අයවැය ලේඛනය ඇමතිවරයාගේ අනුමැතිය සහිත ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වූවද, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ කළමනාකරණ භාර අරමුදල් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| | (iii) 4.2 (ආ) ඡේදය | කළමනාකරණ භාර අරමුදලට ලැබෙන සියළුම ලැබීම් වෙනුවෙන් නිල ලදුපතක් නිකුත් කිරීමට දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන කටයුතු කර නොතිබුණි. |

(iv) 4.2 (ඈ) ජේදය — පවත්වාගෙන යන බැංකු ගිණුම් හා පොත් පත් නිතිපතා සසඳා එහි ප්‍රගතිය රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය පියවර ගෙන නොතිබුණි.

**(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

(i) 5.4.4 මාර්ගෝපදේශය — 2014 වර්ෂයේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයට ප්‍රදර්ශන කුටිය ඉදිකිරීමට කොන්ත්‍රාත්කරුට වැඩ ආරම්භ කිරීමට පෙර අත්තිකාරම් මුදල් ලෙස සියයට 50 කට සමාන රු.805,000 ක් ගෙවා තිබුණි.

(ii) 5.4.8 මාර්ගෝපදේශය — දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රු.1,610,000 ක් වටිනා කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

## 3.9 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම් (අරමුණින් බැහැරවීම් යනාදිය)**

අමාත්‍යාංශය සිය අරමුණුවලට බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව හා අතිගරු ජනාධිපතිතුමාගේ අට අවුරුදු කාලය සඳහා සුභාෂිංශන එක් කිරීම සඳහා පුවත්පත් 09 ක දැන්වීම් පළකිරීමට රු.2,535,200 ක්ද, දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත කිරීම වෙනුවෙන් පුවත්පත් 06 ක දැන්වීම් පළකිරීම සඳහා රු.737,581 ක්ද, ඇතුළුව එකතුව රු.3,272,781 ක් වැයකර තිබුණි.

(ii) 2010 මැයි 14 දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති කාර්යාලයේ ලිපිය අනුව අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන වෙත ලැබෙන ප්‍රතිපාදන අරපිරිමැස්මෙන් උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායිතාවයෙන් යුක්තව පරිහරණය කිරීම පිණිස අදාල බලධාරීන් විසින් සෑම ප්‍රයත්නයක්ම ගත යුතු බව පෙන්වා දී

තිබුණත්, අමාත්‍යතුමාගේ මාධ්‍ය ආවරණ කටයුතු සඳහා විවිධ ප්‍රදේශවලට මාධ්‍යවේදීන් රැගෙන යාමට සමාලෝචිත වර්ෂයේදී රු.1,744,800 ක්ද, අමාත්‍යතුමාගේ සංග්‍රහ වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.961,083 ක්ද, නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යාලය සඳහා වෙසක් සුභ පැතුම් මුද්‍රණයට රු.570,000 ක් ද වැයකර තිබුණි.

**3.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

අමාත්‍ය කාර්යාලයේ මාධ්‍ය ඒකකයට 2009 වර්ෂයේදී රු.603,232 ක් වැය කර මිලදී ගත් විඩියෝ කැමරාව 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාල පරාසය තුළ එම කැමරාව මිලදීගත් ආයතනයෙන්ම අවස්ථා 06 කදී එකතුව රු.507,800 ක් වැය කර අළුත්වැඩියා කර තිබුණි. කැමරාව මිලදී ගැනීමේදී වසරක වගකීම් කාලයක් පැවතුණද, වසරක් ගත වීමට පෙර රු.18,500 ක් වැය කර අළුත්වැඩියා කර තිබුණි. මෙම කැමරාව අපරික්ෂාකාරීව පරිහරණය කරන බව වාර්තාවී තිබුණු අතර 2014 වර්ෂයේදී රු.131,000 ක අළුත්වැඩියාවෙන් පසුව 2014 ඔක්තෝබර් මාසයේදී රු.576,350 ක් වැයකර නව වීඩියෝ කැමරාවක්ද මිලදීගෙන තිබුණි.

**3.11 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශයේ වාහන 05 කට අනතුරුවලින් සිදුවූ එකතුව රු.1,725,454 ක අලාභහානි සිදු වී තිබුණි. මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ඉදිරිපත් කර තිබුණු ප්‍රාරම්භක වාර්තාව අනුවද වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන නොතිබුණි. 2015 අප්‍රේල් 30 දින වන විටත් පූර්ණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. එසේම එම වාහනවලින් එක් වාහනයක සිදුවූ රු.567,514 ක අලාභය විසර්ජන ගිණුමෙහි අනාවරණය කර නොතිබුණු අතර අනෙක් වාහනයේ අලාභය ප්‍රාරම්භක වාර්තාවේ දක්වා නොතිබුණි.

(ආ) 2013 ජුලි 31 දින අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ ඇතිවූ ගින්නෙන් වූ රු.677,047 ක අලාභය සමාලෝචිත වර්ෂයේදීද විසර්ජන ගිණුමේ දක්වා තිබුණද, මෙය නිරවුල් කර ගැනීමේ කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.12 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2010 පෙබරවාරි මාසයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.11,925,900 ක් සතොස ආයතනයට ගෙවල් කුලී ලෙසද, එම ගෙවීම් පදනම් කර ගෙන සියයට 2 ක් ජාතිය ගොඩ නැගීමේ බද්ද හා සියයට 12 ක් එකතු කළ අගය මත බදු ලෙස පිළිවෙලින් රු.236,795 ක් හා රු.1,428,008 ක් වශයෙන් එකතුව රු. 1,664,803 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 2014 වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටි ඉදි කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ආයතනය සමඟ අමාත්‍යාංශය ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණු අතර කොන්ත්‍රාත්තුවද නිසි පරිදි ඉටුකර නොතිබුණි. මේ වෙනුවෙන් කොන්ත්‍රාත් ආයතනයට ගෙවූ රු.805,000 ක් අත්තිකාරම් මුදල ඉටු කරන ලද කාර්යයට ප්‍රමාණවත් බව තීරණය කර තිබුණි.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 20 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 01 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 271 | 225 | 46 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 53 | 44 | 09 |
| | **එකතුව** | **353** | **290** | **63** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 63 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 4. ශීර්ෂ 298 - මිනුම් ඒකක, ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුව

### 4.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව |
| (iv) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුරාසි 214 ප්‍රකාරව |
| (v) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |

### 4.2 විගණන සාක්ෂි නොවීම

ස්ථාවර වත්කම් ලේඛනය හෝ විස්තරාත්මක උපලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා දෙපාර්තමේන්තුවේ නොතිබීම නිසා එකතුව රු.645,622,066 ක ස්ථාවර වත්කම් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

### 4.3 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

වැය විෂයයක් සඳහා රු.9,002,831 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**4.4 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.44,149,708 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

විෂය අංක 29801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි රු.889,212 ක ශේෂ වර්ෂ 1 සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**4.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණත් එය වාර්ෂික අයවැයට සමගාමීව සකස් කර නොතිබුණු බැවින් එහි ක්‍රියාකාරී විෂයයන් ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳීමට නොහැකි විය.

**4.7 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති , රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිත හා සේවා පනත | | |
| (i) 35(2) වගන්තිය | 63,113,245 | සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ආදායමෙන් 1/3 ක්වූ රු.54,282,268 ක මුදල හා 2013 වර්ෂයට අදාලව රාජ්‍ය ආදායමට බැර කළ යුතු |

| | |
|---|---|
| | රු.8,830,977 ක් ද ඇතුළුව එකතුව රු.63,113,245 ක් විධිමත් අනුමැතියකින් තොරව රජයේ ආදායමට බැර නොකර ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් යොදවා ගෙන තිබුණි. |
| (ii) 20(1)(අ) හා 37 වගන්ති | පනතේ විධිවිධාන ප්‍රකාරව වෙළඳාමේදී භාවිතා වන සියළුම මිනුම් උපකරණ වාර්ෂිකව සත්‍යාපනය කළ යුතු වුවද, එසේ සෑම උපකරණයක්ම සත්‍යාපනය කරන බව තහවුරු කරගැනීමේ නිසි ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 1646 | 2014 වර්ෂයට අදාලව අමාත්‍යාංශයේ සංචිත වාහනවල දෛනික සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| 1997 පෙබරවාරි 03 දිනැති - අංක 06/97 චක්‍රලේඛය | වැඩ බලන කාලය මාස 3 ක උපරිමයකට යටත් විය යුතු වුවත්, 2009 මැයි 05 දින හිටපු අධ්‍යක්ෂකවරයා විශ්‍රාම යාමෙන් පසු එදින සිට 2014 අප්‍රේල් 01 දින වන විටත් එම පුරප්පාඩුව නොපියවා වැඩ බලන පදනම |

මත නිලධාරියකු එම තනතුරට අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව පත්කර කර තිබුණි.

**(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ -**

| | | |
|---|---|---|
| (i) 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පී/එෆ්/437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | මිනුම් ඒකක ප්‍රමිත හා සේවා අරමුදලට අදාළ වන පරිදි නියමිත රක්ෂණ ආවරණයන් ලබා ගත යුතු වූවත්, එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.1(අ) ජේදය | - | මිනුම් ඒකක ප්‍රමිත හා සේවා අරමුදලේ අයවැය ලේඛනය 2014 සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත හා මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**4.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කීපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සත්‍යාපක්ෂණ මධ්‍යස්ථාන හා දිනයන් පිළිබඳව වෙළඳුන් දැනුවත් කිරීමේ කාර්යය සිදුකර ගැනීමට අරපිරිමැසුම්දායී සන්නිවේදන ක්‍රම තිබියදී ඒවා අනුගමනය නොකර පුවත් පත් දැන්වීම්වලට 2014 වර්ෂයේදී රු.1,960,757 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ සත්‍යාපක්ෂණ මධ්‍යස්ථාන හා දිනයන් නිශ්චය කිරීමට පූර්ව නිශ්චය කළ වැඩසටහන් නොතිබීමත්, වෙළඳුන් භාවිතා කරන රැගෙන ගිය හැකි මිනුම් උපකරණ පමණක් මෙම මධ්‍යස්ථාන තුළ සත්‍යාපක්ෂණයවීමත් හා දැන්වීම ඉලක්ක වන වෙළඳුන්ට දැන්වීමෙන් අවශ්‍ය පණිවුඩය ලැබීමේ ගුණාංගය ඉටුනොවීමත් නිසා පුවත්පත් වියදම නිසි ඵලදායිතාවෙන් යුත් වියදමක් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) 1409 දරන වැය විෂය යටතේ සළසා ගෙන තිබුණු රු.1,100,000 ක ප්‍රතිපාදනවලින් එම අරමුණට පටහැනිව හා අරමුදලේ කාර්යසාධනයට කිසිසේත් අදාල නොවන කාර්යයක් වෙනුවෙන් රු.266,800 ක් වියදම් කර තිබුණි.

**4.9** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 12 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 30 | - | 30 |
| (iii) | ද්විතීයික මට්ටම | 198 | 115 | 83 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 95 | 64 | 31 |
| | **එකතුව** | **339** | **191** | **148** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 148 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) ගණකාධිකාරී හා ගණකාධිකාරී (අභ්‍යන්තර විගණක) තනතුරු පිළිවෙලින් 2012 දෙසැම්බර් 01 දින හා 2014 අප්‍රේල් 09 දින සිට පුරප්පාඩුව පවතින අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා එම තනතුර අනුමත කළ දින සිට 2014 දෙසැම්බර් 31 දින වන විටත් කිසිවකු පත් කර නොතිබීමෙන් මෙම තනතුරු 2015 අප්‍රේල් 29 දින වන විටත් පුරප්පාඩුව පැවැතුණි.

**5. ශීර්ෂ 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව**

**5.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමට අදාල CC 10 ලේඛනය, අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් වූ පාලන ගිණුම දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.

**5.2 විගණන සාක්ෂි නොවීම**

විස්තරාත්මක උපලේඛන, ශේෂය සනාථ කිරීම්, කාල විශ්ලේෂණ හා සමීක්ෂණ මණ්ඩල වාර්තා නොතිබීම නිසා ආහාර මිලදී ගැනීමේ හා බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුමේ එකතුව රු.1,115,654,365 ක මුදල්වලට අදාල වූ ගනුදෙනු 12 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**5.3 විසර්ජන ගිණුම**

**5.3.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 50 හි විධිවිධාන පරිදි නිසි පූර්ව ඇගයීමකින් තොරව ප්‍රතිපාදන සලසාගෙන නොතිබීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 03 ක හා එක් මූලධන වැය විෂයයක එකතුව රු.1,577,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.649,334 ක ඉතිරිවීම් පැවතුණි.

(ආ) 300-1-1-2001 වැය විෂයය සඳහා රු.10,000,000 ක් වාර්ෂික ඇස්තමේන්තු මඟින් වෙන්කර ගෙන තිබුණද, වර්ෂය තුළ ඉන් කිසිදු මුදලක් වැය නොකර රු.4,310,000 ක් ප්‍රාග්ධන වැය විෂයකට මාරුකර රු.5,690,000 ක ඉතිරි මුදල උපයෝජනයකින් තොරව පැවතුණි

.

(ඇ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවති දැයට කිරුළ වැඩ සටහන යටතේ මහව ආහාර ගබඩාවක් ඉදිකිරීමට 300-1-1-2502 වැය විෂයය යටතේ රු.10,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, එකී ගබඩාව ඉදිනොකර එම මුදල වේයන්ගොඩ විද්‍යාත්මක ගබඩා ඉදිකිරීමේ II අදියරේ මුදල් ගෙවීම සඳහා වැයකර තිබුණි.

## 5.4 පොදු තැන්පත් ගිණුම

----------------------

දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන පොදු තැන්පත් ගිණුම් තුනෙන් දෙකක් 2014 වර්ෂය අවසානයේ තුලනය කර නොතිබුණු අතර භාණ්ඩාගාර පරිගණක සටහන් වල දැක්වුණු වර්ෂයේ හරකිරීම්, බැරකිරීම් සහ 2014 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂය දෙපාර්තමේන්තු පොත්වල පැවති ශේෂ ලෙස සාවද්‍යාව දක්වා තිබුණි.

## 5.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

----------------------------------------------------------------------

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු රු.2,142,767 ක ශේෂ වර්ෂ 1 සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී *තිබුණි.*

## 5.6 ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම්

-----------------------------------

අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව අත්තිකාරම් ගිණුම් කාර්යයන් 2 ක ඇවර කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණු අතර, එම ඇවර කිරීමේ කටයුතු 2014 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 10 ක කාලයක් ගත වී තිබුණත්, එම ඇවර කිරීමේ කටයුතු නිම කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආහාර මිලදී ගැනීමේ හා බෙදා හැරීමේ අත්තිකාරම් ගිණුම 2005 ජනවාරි 01 දින සිට ඇවර කරමින් පවතින අතර එදිනට පැවති රු.3,772,135 ක නිරවුල් නොවූ ණය ශේෂය සහ වර්ෂ 1985-2004 කාලය තුළ ඇතිවූ රු.4,612,880,682 ක කාරක පාඩුව කපා හැරීමට 2010 සැප්තැම්බර් 28 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. සංදේශයේ සඳහන් වටිනාකම කපා හැරීමට 2010 නොවැම්බර් 04 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණත් මෙකී සංදේශය සළකා බැලූ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් ඉහත කී කාලය තුළ ලබා තිබූණු කාරක ලාභ සැලකිල්ලට ගෙන රු.981,398,869 ක් කපා හැර ගිණුම්ගත කිරීමට හා අදාල ක්‍රියාපටිපාටිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැපයීමට එකඟ වී තිබුණි. මේ අනුව, එකී වටිනාකමකින් 2012 හා 2013 වර්ෂවලදී රු.222,779,360 ක් කපාහැර තිබුණු අතර තවදුරටත් කපා හැරීමට ඇති ශේෂය රු.758,619,509 ක් වුවද, ගිණුමේ සමුච්චිත අලාභය ලෙස රු.718,258,491 ක් දක්වා තිබීම හේතුවෙන් රු.40,361,081 ක වෙනසක් නිරූපණය විය.

(ආ) ආහාර දෙපාර්තමේන්තුව විසින් බාහිර ආයතනවලට කුලියට ලබාදුන් ගබඩා 66 කින් 2014 දෙසැම්බර් 31 දිනට රු.51,823,663 ක් අයවිය යුතු හිඟ ගබඩා කුලීවලට අදාල ගබඩා 24 ක් 2015 ජූනි 23 වන විට නැවත පවරාගෙන තිබුණද, ඔවුන්ගෙන් අයවිය යුතුව තිබුණු රු.31,881,372 ක හිඟ කුලී 2015 ජූනි 23 දක්වා අයකරගෙන නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු.388,325,264 ක ණය ගැති ශේෂ අයකර ගැනීම ඉතාම දුර්වල මට්ටමක පැවතුණි.

(ඈ) සේවය හැරගිය/ සේවයෙන් පහකළ/ වැඩ තහනම් කළ තොරතුරු සොයා ගත නොහැකි හා විශ්‍රාම ගිය ගබඩා භාරකරුවන් 269 දෙනෙකුගෙන් 2014 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණු මුදල්වල එකතුව රු.43,713,183 ක් විය.

## 5.7 කාර්යසාධනය

### 5.7.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු නොකළ අවස්ථා පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පිළියෙල කළ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම අනුව කොළඹ සාර්ක් ප්‍රඥප්තිය අනුව සාර්ක් කලාපීය රටවල අවශ්‍යතා සඳහා මෙට්‍රික් ටොන් 8,000 ක විශේෂ සහල් ආරක්ෂිත තොගයක් පවත්වා ගෙන යාමත්, 2009 ඔක්තෝබර් 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙට්‍රික් ටොන් 50,000 ක ආරක්ෂිත සහල් තොගයක් පවත්වා ගෙන යාම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද , 2014 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතුව සහල් ආරක්ෂිත තොගයක් නොමැති බව දන්වා තිබුණි. කෙසේ වුවද, වාර්ෂික අයවැය ලේඛනය මඟින් නිසි පරිදි ප්‍රතිපාදනයන් සළසා නොතිබීම නිසා යෝජිත පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි වූ බව ආහාර කොමසාරිස්තුමිය විසින් 2015 ජූලි 24 දින විගණනයට දන්වා තිබුණි.

**(ආ)** දෙපාර්මේන්තුව සතු ගබඩා 03 ක අදාළ අමාත්‍යාංශය නියම කරන අවශ්‍යතාවයන්ට අනුව ලූණු, බඩ ඉරිඟු සහ මුං ඇට ආරක්ෂිත තොගයක් පවත්වා ගෙන යාමත් ඒවායේ ගුණත්වය සහ තොග අඩුවීම් පරීක්ෂා කිරීමත් නොකඩවා ලක් ස.තො.ස හරහා නිකුත් කිරීමට සැලැසුම් කර තිබුණද, 2014 වර්ෂය තුළ එවැනි තොග පවත්වා ගෙන යාමක් සිදුවී නොතිබුණි.

**5.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**------------------------------------**

**ගැලපුම් කළයුතු ශේෂ**

**-------------------------**

දෙපාර්මේන්තුව විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව වර්ෂ 03 ට වැඩි උපලබ්ධි නොවූ තැන්පතුවල වටිනාකම රු.1,155,065 ක් බව නිරීක්ෂණය විය.

**5.9 අවිධිමත් ගනුදෙනු**

**------------------**

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

ආහාර දෙපාර්තමේන්තුව සතු කහඳාව ආහාර ගබඩා පරිශ්‍රයේ පර්චස් 130 ක ඉඩම, අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි පෞද්ගලික සමාගමකට කර්මාන්තශාලා ගොඩනැගිලි ඉදිකර කර ගැනීමට වසර 05 ක කාලයකට රු.32,500 ක මාසික බදු කුලී පදනම යටතේ ලබා දී තිබුණි. මෙහි පර්චස් 92 ක ඉඩම් ප්‍රමාණයක වර්ග අඩි 25,080 ක නව කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සමාගම මඟින් සැලැසුම් සකස් කර තිබුණි. මෙම ඉඩම තුළ පිහිටි වර්ග අඩි 4,090 ක ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ආහාර ගබඩාව කඩා ඉවත් කර ඒ වෙනුවට ඉඩමේ ගබඩාවක් ඉදිකර තෙමසකදී ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට භාරදීමට ගිවිසුම් ගත වී තිබුණද, 2015 ජුනි 30 දිනය වන විටත් ගබඩාව භාරනොදී සමාගමට අයත් භාණ්ඩ ගබඩා කර තිබුණි.

**5.10 කළමනාකරණ දුර්වලතා**

**-------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) සමූපකාර තොග වෙළඳ සංස්ථාව පාවිච්චි කරමින් තිබූ ආහාර දෙපාර්තමේන්තුවට අයත් කුරුණෑගල ගැට්ටුවාන ආහාර ගබඩා 02 ක් එම දෙපාර්තමේන්තුවට නැවත භාරනොදී එකී ආයතනය විසින් ලංකා ස.තො.ස ආයතනයට පවරා දී තිබුණි. මෙම ආයතන 02 න් කිසිදු මුදලක් ආහාර දෙපාර්තමේන්තුවට නොලැබුණු අතර 2005 වර්ෂයේ සිට 2015 මැයි

31 දින දක්වා වු කාලයට එකතුව රු.7,418,251 ක හිඟ ගබඩා කුලී දෙපාර්තමේන්තුවට අය වීමට තිබුණි.

(ආ) කුරුණෑගල මල්කඩුවාව ගබඩාව සහ කාර්යාලය බදු දීමේදී ආහාර දෙපාර්තමේන්තුව සහ පෞද්ගලික සමාගමක් සමඟ ඇතිකරගත් බදු කුලී ගිවිසුම අනුව රු.50,000 ක් නොඉක්මවන සුළු අළුත්වැඩියාවන් පමණක් සිදුකර ගැනීමට බදුකරුට බලය ලබාදී තිබුණි. මාසික කුලියෙන් අළුත්වැඩියා වියදම් හිලව් කිරීමටත් අළුත්වැඩියා කරන මාස 03 ක කාලය තුළ කුලී රහිත සහන කාලයක් ලබාදීමේ අනුමැතිය මත රු.2,543,593 ක මුදලකට අළුත්වැඩියාවන් සිදුකිරීමට අනුමැතිය ලබාදී තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම අළුත්වැඩියා නිසි පරිදි සිදුකර නොතිබුණු අතර මෙම සමාගම 2014 ජූනි 01 දින සිට 2015 මැයි 31 දින දක්වා වු කාලයට එකතුව රු.1,417,031 ක බදු කුලී දෙපාර්තමේන්තුවට ගෙවා නොතිබුණි.

(ඇ) වේයන්ගොඩ ගබඩා සංකීර්ණයේ අංක 11 හා 09 ගබඩා පිළිවෙලින් 2005 හා 2006 වර්ෂවල පෞද්ගලික ආයතනයකට බදු දී තිබුණි. එයින් අංක 09 දරන ගබඩාව 2008 වර්ෂයේ නැවත දෙපාර්තමේන්තුවට භාරදී තිබූ අතර ඒ සඳහා 2006 ජනවාරි 27 දින සිට 2008 ජූනි 09 දින දක්වා හිඟ බදු කුලිය වූ රු.823,460 ක 2015 ජූලි 02 දින දක්වා අයවී නොතිබුණි. එකී සමාගම විසින් මෙම ගබඩාව පාවිච්චි කිරීමේදී සිදුකර තිබුණු හානි සඳහා රු.607,500 ක් ගෙවිය යුතු බවට තක්සේරු කර තිබුණද, එකී අලාභයද, රු.95,859 ක විදුලි බිලද, එකී සමාගම ගෙවා නොතිබීම නිසා එම ගබඩාවේ සන්තකය සහ හිඟ ගබඩා කුලිය අයකර ගැනීමට අධිකරණයේ නඩු විභාග වෙමින් පැවතුණි.

(ඈ) කහවත්ත රජයේ ආහාර ගබඩා 02 ක් පන්නිලපත්තු විවිධ සේවා සමුපකාර සමිතියට 1993 වර්ෂයේ සිට බදු දී තිබුණු අතර එකී සමිතිය මඟින් තක්සේරු කළ රු.39,500 ක මාසික කුලියට වඩා අඩු කුලියක් ගෙවීම නිසා 2015 මැයි 31 දිනට එම සමිතියෙන් අයවිය යුතු කුලී මුදල රු.1,281,964 ක් වී තිබුණි.

(ඉ) පල්ලෙකැලේ ආහාර ගබඩාව බදු පදනම මත ලබාගත් බදුකරු රු.900,000 ක මූලික ඇප තැන්පතුව පමණක් ගෙවා තිබූ අතර 2013 ඔක්තෝබර් 03 දිනෙන් පසු කිසිදු මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවා නොතිබුණි. බදුකරුගෙන් රු.3,590,768 ක හිඟ බදු කුලී මුදලක් 2015 මැයි 31 දිනට අයවීමට තිබුණු අතර බදු කුලී ගිවිසුමේ වලංගු කාලයද 2014 අගෝස්තු 01 දින විට ඉක්මවා තිබුණි.

(ඊ) දෙපාර්තමේන්තුව සතු අනිකුත් ගබඩා 11 සඳහා 2015 මාර්තු 31 දිනට අයවිය යුතු රු.21,214,875 ක ගබඩා කුලී අයවී නොතිබුණු අතර තවත් ගබඩා 36 ක් සහ කාර්යාල පරිශ්‍ර 05 ක් රාජ්‍ය ආයතනවලට කුලී රහිතව ලබාදීම හේතුවෙන් ඉන් කිසිදු ආදායමක් අයවී නොතිබුණි.

(උ) වේයන්ගොඩ විද්‍යාත්මක ගබඩාවේ ගබඩා කිරීම සඳහා 2012 හා 2013 වර්ෂයන්හිදී පෞද්ගලික සහල් මෝල් හිමියන් දෙදෙනෙකු වෙත සහල් ලබා දීමේ පදනම මත නිකුත් කළ වී සඳහා රු.6,724,121 ක්ද, ආපසු ලබානොදුන් පොලිසැක් උර වෙනුවෙන් රු.79,567 ක්ද 2015 ජූනි 30 දිනටත් අයකර ගැනීමට නොහැකිවූ මුදල් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් නීතිමය කටයුතු ආරම්භ කර තිබුණි.

## 5.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 03 | 02 | - |
| (ii) | ද්විතියික මට්ටම | 115 | 46 | 69 | - |
| (iii) | තෘතියික මට්ටම | 03 | - | 03 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 102 | 65 | 37 | - |
| (v) | වෙනත් අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 08 | - | 08 |
| | **එකතුව** | **225** | **122** | **111** | **08** |

සේවක පුරප්පාඩු 111 ක් පිරවීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

## 6. ශීර්ෂ 301 – සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

---------------------------------------------------

### 6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

----------------------

දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සමූපකාර සංවර්ධන අරමුදලේ සහ සමූපකාර අතිරික්ත අරමුදලේ 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 6.2 විසර්ජන ගිණුම

-----------------

**අයවැය විචලනය**

-----------------

වැය විෂයයන් 05 ක් සඳහා එකතුව රු.15,200,000 ක අධි ප්‍රතිපාදින සළසා තිබීම නිසා උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 57 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 6.3 පොදු තැන්පත් ගිණුම

-----------------------

නැගෙනහිර පළාතේ ගංවතුරෙන් විපතට පත්වූවන්ට අත්‍යාවශය භාණ්ඩ සැපයීම වෙනුවෙන් නැගෙනහිර පළාත් සමූපකාර කොමසාරිස්ගෙන් අයවිය යුතු මුදලින් කොටසක් ලෙස 2011 අගෝස්තු මාසයේදී ලැබී තිබුණු රු.6,607,000 කින් රු.107,000 ක් 2015 මැයි 17 දින වන විටත් නිරවුල් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

### 6.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

------------------------------------------------------------------

විෂය අංක 30101 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පාලන ගිණුම හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ එකතුව රු.229,187 ක් වෙනසක් පැවැතුණි. එම වෙනස සසඳා පිළියෙල කර තිබුණු සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව තවදුරටත් රු.131,196 ක් වෙනසක් හඳුනාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසයේදී නිලධාරියෙකුට ගෙවූ රු.139,900 ක ආපදා ණය මුදල 2014 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයට ඇතුළත් කර නොතිබුණි. එමෙන්ම ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.7

වගන්තියට පටහැනිව 2015 අප්‍රේල් 30 දින වන විටත් ණය මුදලට අදාල වාරික ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඈ)** 2014 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 22 ගෙන් අයවිය යුතු රු.224,815 ක ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 වගන්ති හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මෙම ශේෂවලින් රු.6,568 ක ශේෂයක් වර්ෂ 5 ක සිටද, රු.2,700 ක ශේෂයක් වර්ෂ 10 සිටද, එකතුව රු.215,547 ක ශේෂයන් අවුරුදු 13 ට වැඩි කාලයක සිටද හිඟහිටව පැවැතුණත් එම ශේෂ 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනිමට අපොහොසත් වි තිබුණි.

**(ඇ)** 2013 දෙසැම්බර් 31 දිනට මුදාහැරී නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.62,713 ක ශේෂ 2014 ජනවාරි 01 දිනට සාමාජික ණය ලේඛනයේ ඉදිරියට ගෙනවිත් නොතිබුණු අතර, එම ණය ශේෂ නිරවුල් වූ ආකාරය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට වෙනත් දෙපාර්තමේන්තුවලට මුදාහැර තිබුණු නිලධාරීන් දෙදෙනකුගෙන් රු.98,356 ක් අය විය යුතුව තිබුණත්, එම ණය ශේෂවලින් රු.96,212 ක් වර්ෂ 1 සිට වර්ෂ 5 ක් දක්වා පරාසයක කාලයක සිට හිඟහිටිව පැවැතුණි. හිඟහිටි කාලය හඳුණාගෙන නොතිබුණු ශේෂය රු.2,144 ක් වී තිබුණි.

**(ඉ)** 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 ක සිට වර්ෂ 13 ක කාල පරාසයක සිට විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් හිඟහිටි එකතුව රු.662,019 ක ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.4 හා 4.2.5 වගන්ති ප්‍රකාරව කටයුතු කර අයකර ගෙන නොතිබුණි.

**(ඊ)** 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 සිට වර්ෂ 13 ක කාල පරාසයක සිට පැවැත එන වැඩ තහනම් හා සේවය හැරගිය නිලධාරීන්ගෙන් එකතුව රු.524,651 ක ණය ශේෂ හිඟ හිටිව පැවැතුණි. එම ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව කටයුතු කර 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

**6.5 වත්කම් කළමනාකරණය**

---------------------------

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---------------------------------------------

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තාව 2015 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත

ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**6.6 කාර්යසාධනය**

2014 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙමසකට වරක් බැගින් වර්ෂයකදී පළාත් කොමසාරිස්වරුන්ගේ රැස්වීම් 06 ක් පැවැත්විය යුතු බව සඳහන්ව තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) ක්‍රියාකාරි සැලැස්ම අනුව සමුපකාර සමිති විගණනයේදී දෙපාර්තමේන්තු මට්ටමින් ගිණුම් කාරක සභා 04 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණද , එවැනි කාරක සභා රැස්වීම් සමාලෝචිත වර්ෂයේදී පවත්වා නොතිබුණි.

**6.7 කළමනාකරණ දුර්වලතා**

2014 දැයට කිරුල වැඩසටහනට සමගාමීව අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.මිලියන 2.5 බැගින් සමුපකාර සමිති 04 කට මෙගා කෝප්සිටි වැඩිදියුණු කිරීමට ලබාදුන් රු.මිලියන 10 ක මුදල වැය කළ ආකාරය පිළිබඳ වාර්තාවක් අදාළ පළාත් කොමසාරිස්වරුන්ගෙන් ලබාගැනීම හෝ පසුවිපරම් කටයුතු සිදුකර හෝ නොතිබුණි.

**6.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 06 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 07 | - | 07 |
| (iii) | ද්විතියික මට්ටම | 105 | 85 | 20 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 20 | 17 | 03 |
| | **එකතුව** | **141** | **108** | **33** |

ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක්ද සමඟ පුරප්පාඩු 33ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**7. ශීර්ෂ 302 - සමුපකාර සේවක කොමිෂන් සභාව**

**7.1 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.210,000 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 29 ක් හා සියයට 64 ක් වී තිබුණි.

(ආ) 2014 වර්ෂයට අදාළ ගෙවිය යුතුව තිබුණු එකතුව රු.41,127 ක වියදම් අයිතම් 02 ක් විසර්ජන ගිණුමේ බැරකම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.

**7.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ අතර රු.15,167 ක වෙනසක් පැවැතුණි.

(ආ) විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.220,000 ක ණය ශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කර 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

**7.3 වත්කම් කළමනාකරණය**

---------------------------

2014 ඔක්තෝබර් 18 දිනැති අංක 174 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වත්කම්වලට අදාළව සංකේත අංක වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

**7.4 කාර්යසාධනය**

-----------------

2014 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

--------------------------------------------------

කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) 1972 අංක 12 දරන සමූපකාර සේවක කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම කොමිෂන් සභාවේ කාර්යයක් වුවද, සකස් කළ කෙටුම්පත් පනතට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන සංශෝධන කිරීමට 2015 ජූනි 30 දින තෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) සමූපකාර සේවකයින් සඳහා නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම 2006 වර්ෂයේ යෝජිත ප්‍රධාන කාර්යයක් වූව ද 2015 ජූනි 30 තෙක් මෙම කාර්යය ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

**7.5 විසඳා නොතිබූ විගණන ඡේද**

--------------------------------

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු පහත සඳහන් විගණන ඡේද සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු නිමකර නොතිබුණි.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2012 | 1.6 | පනත සංශෝධනය කිරීම හා විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක නොකිරීම. |
| | 1.7 (i) (ii) | සේවක පුරප්පාඩු නොපිරවීම හා ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් නොකිරීම. |

## 7.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 01 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 01 | | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 13 | 09 | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 06 | 05 | 01 |
| | **එකතුව** | **23** | **15** | **08** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පුරප්පාඩු 08 ක් පිරවීමට කොමිෂන් සභාවේ කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ ලේකම් තනතුරට 2013 වර්ෂයේ සිට රේඛීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු පත්කර තිබුණද, 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා එම තනතුර සඳහා ස්ථිර ලේකම්වරයෙකු පත්කිරීමට කටයුතු කර නොතිබුණි.